Liberté • Égalité • Fraternité
RÉPUBLIQUE FRANÇAISE

MINISTÈRE DE LA JUSTICE

2

# අයිතීන් පිළිබඳ ප්‍රකාශනය

## පොලිස් අත්අඩංගුවේ පසු වන අයකුට හිමි විය යුතු සහන

**මත්ද්‍රව්‍යප්‍රවාහනය සහ ත්‍රස්තවාදී ක්‍රියා හැර අපරාධ සහ සංවිධානාත්මක අපරාධ,**
**(වගන්ති 63-1, 706-73 සහ 706-88 - අපරාධ විධිවිධාන පනත)**

**පහත සඳහන් තොරතුරු තමා හට ලබා දිය යුතු වන්නේ තමාට තේරුම් ගත හැකි භාෂාවකින් ය.**

***<u>පොලිස් අත්අඩංගුවේ පසු වන සම්පූර්ණ කාලය තුළ තමාට මෙම ලේඛනය තමා සන්තකයේ තබා ගත හැක</u>***

තමා හට දන්වා සිටින්නේ තමා පොලිස් අත්අඩංගුවේ පසු වන්නේ සිර දඬුවමකින් දඬුවම් කළ හැකි අපරාධයක් හෝ සංවිධානාත්මක අපරාධයක් සිදු කිරීම හෝ සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් සැක කළ හැකි විශ්වාස කටයුතු කරුණක් හෝ කරුණු කිහිපයක් තමාට එරෙහි ව ඇති නිසා ය.

ඔබ හට චෝදනා නගා ඇති වරදකාරී ක්‍රියාව සිදු කරන ලදැයි නිගමනය කර ඇති දිනය, ස්ථානය සහ ඊට අදාළ සීමා සම්බන්ධයෙන් ද පොලිස් අත්අඩංගුවට ගැනීම සාධාරණීකරණය කළ හැකි හේතු දැන ගැනීමට ද ඔබට අයිතියක් ඇත.

පැය 24 ක් දක්වා දිවෙන පොලිස් අත්අඩංගුව අතරතුර මෙකී ක්‍රියා පිළිබඳ ඔබගෙන් ප්‍රශ්න කෙරෙනු ඇත.

මෙකී කාල සීමාව අවසානයේ දී, හෝ පරීක්ෂණය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයා විසින් තවත් පැය 24 ක කාල සීමාවකට පොලිස් අත්අඩංගුව දීර්ඝ කිරීමට තීරණය කළ හැක. එසේ කිරීමට අපහසු අවස්ථාවන් හි දී, අත්‍යවශ්‍ය වේ නම් වීඩියෝ දුරකථන සංවාද ජාල හරහා තමුන් ව මහේස්ත්‍රාත්වරයා වෙත පමුණුවනු ඇත.

විශේෂිත හේතු කාරණා මත හෝ විමර්ශනයේ අවශ්‍යතාව මත, එක් වාරයක් පැය 24 බැගින් වන අතිරේක දීර්ඝ කිරීම් 2 ක් සිදු කිරීමට තීරණය කිරීමේ හැකියාව, සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුට හෝ පරීක්ෂණය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයාට ඇත්තේය.

කෙසේ වෙතත්, පළමු පැය 48 තුළ විමර්ශනය බලාපොරොත්තු වූ ආකාරයට අවසන් කළ හැකි බවට ඒත්තු ගැන්වෙන්නේ නම්, සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුට හෝ පරීක්ෂණය කරනු ලබන මහේස්ත්‍රාත්වරයා විසින් පැය 48 ක කාලයක් සඳහා බලපැවැත්වෙන, එක් වරක් පමණක් දීර්ඝ කළ හැකි පොලිස් රැඳවුම් නියෝගයක් තීරණය කිරීමේ හැකියාව ඇත.

පොලිස් අත්අඩංගුව අවසානයේ මහජන පැමිණිලිකරු හෝ පරීක්ෂණය කරනු ලබන මහේස්ත්‍රාත්වරයාගේ තීරණය මත මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ මුදා හැරීම සිදු කළ හැක. ඔබගේ අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම පැය 72 කට වඩා වැඩි වන්නේ නම් මිස ඔබ අත්අඩංගුවේ පසුවන කාලය ඉක්ම ගොස් පැය 20 කට නොඅඩු කාලයක් තුළ දී ඔබ ව විනිසුරුවරයකු ඉදිරියට මුල් වරට පැමිණවිය යුතු වන්නේ ය.

**ඔබ හට තවදුරටත් දන්වා සිටින්නේ ඔබ හට ඇති අයිතීන් අතරේ:**

### යම් පුද්ගලයන් හට දැනුම් දීම

ඔබ ව පොලිස් අත්අඩංගුවේ රඳවා ඇති බව දුරකථන මාර්ගයෙන් ඔබේ දෙමාපියන්ගෙන් එක් අයකුට හෝ එක් සහෝදරයකුට හෝ සහෝදරියකට හෝ ඔබේ භාරකරුට හෝ ඔබ ව රැකබලා ගන්නා කෙනෙකුට දන්වන මෙන් ඉල්ලීමක් කිරීමට ඔබට හැක.

එසේ ම ඔබට ඔබගේ සේවා යෝජකයාට දැන්වීමට ද හැකියාව ඇත.

ඔබ විදේශීය ජාතිකයකු නම් තවදුරටත් ඔබට ඔබගේ රටේ තානාපති අංශ වෙත දැනුම් දීමේ හැකියාව ඇත.

.

කෙසේ වෙතත් සිදු කරනු ලබන පරීක්ෂණ වල අවශ්‍යතාව සළකා බලා මහජන පැමිණිලිකරු (හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයාට) එකී ඉල්ලීම් වලට විරුද්ධ විය හැක.

නොවැලැක්විය හැකි තත්ත්වයන් යටතේ හැර ඔබගේ ඉල්ලීම සිදු කර උපරිම වශයෙන් පැය 3 ක කාලයක් තුළ ඉතා කඩිනමින් එකී ඉල්ලීම ඉටු කළ යුතු වේ.

### වෛද්‍යවරයකු ලවා පරීක්ෂා කරවා ගැනීම

අත්අඩංගුවේ පසුවන මුල් අවස්ථාවේ පටන් එකී ක්‍රියාමාර්ගයේ දීර්ඝ කිරීමක දී ද ඔබට වෛද්‍යවරයකු ලවා පරීක්ෂා

කරවා ගැනීම සඳහා ඉල්ලීමක් කළ හැකි ය. පළමු වර අතිරේක දීර්ඝ කිරීමක දී ඔබ අනිවාර්යයෙන් ම වෛද්‍යවරයකු ලවා පරීක්ෂාවට ලක් විය යුතු වන අතර, නව වෛද්‍ය පරීක්ෂණයක් ලබා ගැනීමට ඔබට ඇති අයිතිය සම්බන්ධයෙන් ඔබ ව දැනුවත් කරනු ලැබේ.

**ප්‍රකාශ ලබා දීම, ප්‍රශ්න කිරීම් වලට උත්තර දීම හෝ නිහඬ ව සිටීම**

ඔබගේ අනන්‍යතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරු ව වන පරීක්ෂණ අතරතුර ඔබට ඇති අයිතීන් නම්:
- ප්‍රකාශ සිදු කිරීම.
- ඔබගෙන් අසන ලද ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම.
- හෝ නිහඬ ව සිටීම සිදු කළ හැක.

**නීතිඥවරයකුගේ සහය ලැබීමට**

**<u>- නීතිඥවරයකු තෝරා ගැනීම</u>**

අත්අඩංගුවට පත් මුල් අවස්ථාවේ දී සහ අත්අඩංගුව දීර්ඝ කිරීමක දී, එකී දීර්ඝ කිරීම සිදු කරන මුල් අවස්ථාවේ දී ඔබ විසින් තෝරා ගන්නා ලද නීතිඥවරයකුගේ සහාය ලබා ගැනීමට ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය. ඔබ හට නීතිඥවරයකු පත් කර ගැනීමට හැකියාවක් නොමැත්තේ නම් හෝ තෝරා ගත් නීතිඥවරයා සම්බන්ධ කරගත නොහැකි නම් පත් කළ නීතිඥයකුගේ සහාය සඳහා ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.

ඔබ විසින් දැනුම් දෙන ලද තැනැත්තකු විසින් ද ඔබගේ නීතිඥවරයා ව, සමහර විට, පත් කර තිබිය හැක. එවැනි අවස්ථාවක දී ඔබ විසින් එකී නීතිඥවරයාගේ පත් කිරීම අනුමත කළ යුතු වේ.

**<u>- නීතිඥවරයාගේ සේවය ලබා ගැනීම</u>**

නීතිඥවරයාට ඇති හැකියාවන් අතර:
- සිදු කරනු ලබන සාකච්ඡාවේ රහස්‍යභාවය සුරක්ෂිත කරමින් පුරා විනාඩි 30 ක කාලයක් ඔබ සමග සාකච්ඡාවේ යෙදීමට දීර්ඝ කිරීමක දී, එකී දීර්ඝ කිරීම ආරම්භයේ දී ඔබගේ නීතිඥවරයා සමග සාකච්ඡා කිරීමට අළුතින් ඉල්ලීමක් කිරීමට ඔබට හැකි ය.
- තව ද ඔබ විසින් ඉල්ලීමක් සිදු කරන්නේ නම් ඔබගේ විභාග කිරීම් සහ ප්‍රශ්න කිරීම් වල දී ද ඔහුගේ සහාය ලබා ගත හැක.

**<u>- මැදිහත් වීමට ලබා දී ඇති නිශ්චිත කාලය</u>**

කඩිනම් විමර්ශනයක අවශතාව සැලකිල්ලට ගෙන ඔබගේ පරීක්ෂණය ආරම්භ කිරීම සඳහා ඔබගේ නීතිඥවරයාගේ පැමිණීම බලාපොරොත්තුවෙන් ලබා දෙන ලද පැය 2 ක කාලය අවසන් වන තුරු නොසිටීමට ලිඛිත ව ගනු ලබන තීරණය මහජන පැමිණිලිකරු විසින් හෝ පරීක්ෂණය සිදු කරනු ලබන මහේස්ත්‍රාත්වරයා විසින් සිදු කළ හැක.
සුවිශේෂී කරුණු සැලකිල්ලට ගනිමින් පුරා පැය 48 ක කාලයක් සඳහා වන උපරිමයකට යටත් ව නීතිඥවරයකුගේ මැදිහත් වීම කල් දැමීමට හැකියාව ඇත.

**භාෂා පරිවර්තකයකුගේ සහාය ලබා ගැනීම**

ඔබට ප්‍රංශ භාෂාව කථා කළ නොහැකි නම් හෝ තේරුම්ගත නොහැකි නම් ඔබ හට කිසිදු ගාස්තුවක් නොමැති ව, ඔබගේ ප්‍රශ්න කිරීම අතරතුර සහ ඔබගේ නීතිඥවරයා සමග අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාෂා පරිවර්තකයකුගේ සහාය පැතීමට අයිතිය ඇත.

**පොලිස් අත්අඩංගුව අවසන් කරන මෙන් ඉල්ලීමක් කිරීමට ඇති අයිතිය**

මහේස්ත්‍රාත්වරයා විසින් රැඳවුම් නියෝගයක් දීර්ඝ කිරීමට තීන්දු කළ විට එකී නියෝගය අනුව එකී අත්අඩංගුවේ තැබීම දීර්ඝ නොකරන ලෙස, මහජන පැමිණිලිකරුගෙන්, පරීක්ෂණය පවත්වනු ලබන මහේස්ත්‍රාත්වරයාගෙන් හෝ සිවිල් අයිතීන් සහ රඳවා තබා ගැනීම් පිළිබඳ විනිසුරුගෙන් ඉල්ලීමක් කිරීමට ඔබට හැකියාවක් ඇත.

**ඔබගේ නඩු ගොනුවේ ඇති ඇතැම් ලේඛන වලට ඇති ප්‍රවේශය**

ඔබගේ ඉල්ලීම මත හෝ ඔබගේ නීතිඥවරයාගේ ඉල්ලීම මත, වෙනත් අවස්ථාවක දී ඔබගේ අත්අඩංගුවේ රඳවා තබා ගැනීම දීර්ඝ කිරීමකට පෙර පහත දෑ පිරික්සීමට ඔබට හැක:
- ඔබගේ අත්අඩංගුවට ගැනීම දැනුම් දීමට අදාළ කාර්යය සටහන්
- ඔබව පරීක්ෂා කරන ලද වෛද්‍යවරයා විසින් සපයන ලද වාර්තාව හෝ වාර්තා
- ඔබගේ ප්‍රශ්න කිරීම් හා සම්බන්ධ කාර්යය සටහන්